# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 89 — 1973 දෙසැම්බර් 07 වැනි සිකුරාදා — 1973.12.07

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (IIආ) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1741 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1753 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1755 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—පොලිස් (සංශෝධන) පනත් කෙටුම්පත 1973 නොවැම්බර් 30 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ.පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1974.01.01 සිට 74.12.31 දක්වා මෙරට සාදන ලද විශේෂ ලියුම් කවර සැපයීම ... | 74.01.01 |
| 2. 1974.01.01 සිට 74.12.31 දක්වා මෙරට නිපදවන ලද ඇලුමිනියම් භාණ්ඩ සැපයීම ... | 74.01.10 |
| 3. 1974.01 01 සිට 74.12.31 දක්වා මෙරට සාදන ලද කාබන් කඩදාසි සැපයීම ... | 74.01.10 |
| 4. 1974.01.01 සිට 74.12.31 දක්වා මෙරට සාදන ලද සබන් ... ... ... | 74.01.10 |
| 5. දේශීය නිෂ්පාදිත කළු ඔපදැමූ වැහි කැප් සැපයීම ... | 74.01.01 |

ඇලුමිනියම් භාණ්ඩ, කාබන් කඩදාසි සහ සබන් සැපයීම සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂාකරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කල යුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹ පිටත ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ජේ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 දෙසැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

12–122—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) සහ (IIආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.**

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

### බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1974 මුදල් වර්ෂය තුල, කොළඹ (වැලිකඩ කොළඹ රිමාන්ඩ් සහ මැගසින් බන්ධනාගාර) මහර, වතුපිටිවල බන්ධනාගාරවලට වියලි මිරිස් සැපයීම.

ඉහත සඳහන් බන්ධනාගාරවලට 1974. 1. 1 සිට 1974. 12. 31 දක්වා කාලය තුල වියලි මිරිස් සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් කරුවන් විසින් හොඳ තත්ත්වයේ, හොඳින් වියලුනු වියලි මිරිස් ඒ ඒ බන්ධනාගාර වලට ගෙනවුත් භාරදිය හැකි මිළ ගණන් තම ටෙන්ඩර් පත්‍රවල සඳහන් කල යුතුය. මිළ ගණන් ඉදිරිපත් කළ යුත්තේ රාත්තල් ක්‍රමයකටය.

3. ටෙන්ඩර් ෆෝර්ම කොළඹ, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ. එක් එක් බන්ධනාගාර වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට පෙර දින ප. ව. 2 දක්වා පමණි.

4. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් සහිතව, ලියුම් කවරයක බහා සීල් තබා, සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව කියා එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. එසේ නොඑවන ටෙන්ඩර් පත්, ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් බන්ධනාගාර මූලස්ථානයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් කෙළවරේ "...................... බන්ධනාගාරයට වියලි මිරිස් සැපයීමේ ටෙන්ඩරය" යනුවෙන් ලියා මෙහි උපලේඛනයේ දැක්වෙන දිනයන්හි පෙරවරු 10.30 ට පෙර බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති නමට එවිය යුතුය. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් එදින විවෘත කරන වේලාවට එහි පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි උපලේඛණයේ සඳහන් දින පෙ. ව. 10.35 ට ටෙන්ඩර් පත්‍ර බන්ධනාගාර මූලස්ථානයේදී විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් වල සියලු මැකීම් හා වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරු තම කෙටි අත්සන තැබිය යුතුය.

7. මෙහි උපලේඛනයේ සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල්, බන්ධනාගාර මූලස්ථානයේ ප්‍රධාන කායඕලයේ හෝ කොළඹ කච්චේරිය හැර අන් ඕනෑම කච්චේරියක හෝ බැඳ එම කුවිතාන්සිය ඉදිරිපත් කල විට ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

8. යමෙකුට තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා ලිපිය ලැබී දින 10 ක් තුල කොන්ත්‍රාත්තුවට හා ඇප කරයකට බැඳීමට අපොහොසත් වුවහොත් හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නොහැකි වූවොත් තැන්පත් කල මුදල් රාජසන්තක වෙනවාත් හැර රජය සමග කවර කොන්ත්‍රාත්තුවකටවත් එළඹිය නොහැකි සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකල අයගේ නාම ලේඛණයට ඇතුලත් කරනවා ඇත. කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභය වශයෙන් රුපියල් 1,000 ක් අයකර ගැනුමේ බලය ද නීති මගින් බන්ධනාගාර කොමසාරිස්තුමා වෙත පැවරී ඇත.

9. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම එකවර ප්‍රතික්ෂේප කිරීමේ බලය මුලුමණින්ම ටෙන්ඩර් මණ්ඩලය සතුව තබාගනු ලැබේ.

10. දැනට රජයේ කොන්ත්‍රාත්තුවක් භාර ගෙන නොමැති ටෙන්ඩර් කරුවෙක් ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලා සිටීමේදී තම ඉඩ කඩම් සම්පූර්ණ ලිපිනය හා පදිංචි පලාතද ඇතුලත් විස්තර ලිපියක් එම ඉඩම් ආදිය පිහිටි දිස්ත්‍රික්කයේ ආදායම් පාලක නිලධාරි තැනගේ සහතිකයද සමඟ ඉදිරිපත් කළ යුතුය.

11. මේ පිළිබඳ වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. ඒ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කොමසාරිස්.

1973. 11. 23 වැනි දින,
කොළඹ බන්ධනාගාර මූලස්ථානය.

#### ඉහත සඳහන් උපලේඛනය

| බන්ධනාගාරය | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ. | | ඇප තැන්පත් මුදල රු. ශ. | | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය සහ විවෘත කරන දිනය |
|---|---|---|---|---|---|
| කොළඹ බන්ධනාගාර | ... 50 | 0 | ... 1,000 | 0 | 1973.12.19 |
| මහර බන්ධනාගාර | ... 25 | 0 | ... 500 | 0 | 1973.12.19 |
| වතුපිටිවල බන්ධනාගාරය | ... 25 | 0 | ... 200 | 0 | 1973.12.19 |

12–166/1—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

### 1974 මුදල් වර්ෂය තුළ කොළඹ (වැලිකඩ, කොළඹ රිමාන්ඩ් සහ මැගසින් බන්ධනාගාර) සහ කුංඹසාලේ බන්ධනාගාරවලට ගවමස් සැපයීම

ඉහත සඳහන් බන්ධනාගාරවලට 1974 ජනවාරි 1 වෙනි දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා ගවමස් සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් මිල ගණන් ඉදිරිපත් කළ යුත්තේ, "වෙළඳ ද්‍රව්‍ය" වශයෙන් මිස "ආහාර" ක්‍රමයට නොවේ. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට කැමති යම් උපලේඛනයට හෝ උපලේඛනයන්හි ඉහත සඳහන් සියලුම විෂයයන් සඳහා මිළ ගණන් ඉදිරිපත් කල යුතුය. 'ආ' සඳහන් උපලේඛනයේ ඕනෑම එකකට හෝ වැඩි ගණනකට මිල ගණන් ඉදිරිපත් කිරීමට පුළුවන. ඒ ඒ උපලේඛනය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් භාරගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය සතුය. සැපයිය යුතු ද්‍රව්‍ය පහත එන උපලේඛනයන් ගෙන් බලාගත යුතුයි :—

උපලේඛනය (ආ)

හරක් මස්
එළු මස්
ලිවර්
කුකුලු මස්
කීන් තර

3. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව," කියා එවිය යුතුයි.

එක ටෙන්ඩර් ෆෝර්මයක සඳහන් කළ යුත්තේ එක උපලේඛනයක් සඳහා මිල ගණන් පමණකි.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. රෙජිස්ටර් තැපැලෙන් නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ, කොළඹ බන්ධනාගාර මූලස්ථාන [illegible] [illegible]

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ ".....................බන්ධනාගාරය.................. උපලේඛනයේ සඳහන් බඩු සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 9 වැනි වගන්තියේ සඳහන් දින පෙරවරු 10.30 ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ එවිය යුතුයි. ටෙන්ඩර්කරුවනට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. මෙහි 9 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35 ට කොළඹ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමාගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් ෆෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ ප්‍රධාන කායඕලයෙන් ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට (9 වෙනි ඡේදය බලන්න) පෙර දින ප. ව. 2 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර් කරු විසින් තමාගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඕලයේ හෝ කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) තැන්පත් කොට එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ.

යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුලත කොන්ත්‍රාත්තුවකට හා ගැසරොන්ටුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට හෝ නුසුළුවන් වුව හොත්, තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවාත් සමග [illegible] කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි [illegible] [illegible] ඇත.

තවද, කොන්ත්‍රාත්තු කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ මුදලෙන් රු. 2,500ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස් වරයාට ගෙවීමට එම ටෙන්ඩර්කරුවාට සිදුවනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වරයා වෙත පැවරී ඇත.

ටෙන්ඩර් භාරගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, නැති නම් එහි ගෙන ගොස් භාර දුනහොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

| | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|
| (අ) කොළඹ බන්ධනාගාර (වැලිකඩ, කොළඹ රිමාන්ඩ් සහ මැගසින්) | රු. 100 ශ. 0 | ... රු. 1,500 ශ. 0 | 1973.12.19 |
| (ආ) කුංඩසාලේ බන්ධනාගාර | රු. 100 ශ. 0 | ... රු. 1,000 ශ. 0 | 1973.12.19 |

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛනය සඳහා තැන්පත් කරනු ලබන මුදල වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරන මිළ ගණන් ඉලක්කමෙන් මෙන් වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ ම එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර් කරුවන් එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට ඔවුන් වෙනුවෙන් ඇපකරුවන් වශයෙන් පෙනී සිටීමට කැමති වගකිව යුතු පුද්ගලයන් දෙදෙනෙකු ගේ නම් ඉදිරිපත් කළ යුතුය.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන බවට යුදුසු ඇප කරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ සඳහන්ව ඇත. අවශ්‍ය සියලුම විස්තර මෙම දැන්වීමේ 6 වෙනි ඡේදයේ සඳහන් කාර්යාලයෙන් ලබාගත හැක.

13. ඒ ඒ ටෙන්ඩර් සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණ යෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණ යෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශ යෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින් ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත් තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අනුරු බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේදී කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාතුවක් භාර නොගත් ටෙන්ඩර් කරුවෙක්, ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තම සම්පූර්ණ නම, සථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම් දේපොල ආදිය පිහිටි දිස්ත්‍රික්ක යේ හෝ කොට්ඨාශය සඳහන් කොට. තමා පදිංචි පළාතේ ආදායම් පාලකතැන විසින් සහතික කරන ලද රිපෝර්තුවක් එවිය යුතුය. දේපොල විස්තර ද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්කරුවකු කුමන කොට්ඨාශක හෝ කොට්ඨාශ වල එම කොන්ත්‍රාත්තු තමා ඉටුකර ඇද්දැයි සඳහන් කළ යුතුයි.

18. ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය. එබඳු නිලධාරියකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේ ද, ගිණිය යුත්තේ ද, ශ්‍රී ලංකා ජනරජය යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිලධාරියා ද ඔහුගෙන් පසුව එම පදවිය දරන්නා වූ නිලධාරියාද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර කොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. ඒ. ද සිල්වා,
වැඩ බලන බන්ධනාගාර කොමසාරිස්.

73.11.23 වැනි දින,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

12.166/2—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### පොලිස් දෙපාර්තමේන්තුව

කොළඹ 1, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන්හි රඳවා ගනු ලබන අයලා ආගමික යන්ට 1974.01.01 දින සිට 1974.12.31 දින දක්වා කාලය තුළ පිසින ලද ආහාර සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

(අ) පොලිස් රඳවා ගැනීමේ කඳවුර—කොම්පඤ්ඤ වීදිය.
(ආ) පොලිස් රඳවා ගැනීමේ කඳවුර සහ නිරෝධායන රඳවා ගැනීමේ කඳවුර—කලේසිමන් නාරම්.

2. පිළිවෙලින් පහත සඳහන් කාර්යාලවල හෝ කොළඹ සහ වවුනියාවෙන් පිටත ඕනෑම කච්චේරියක හෝ රු. 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීමෙන් ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරි පත් කිරීමෙන් 1973 දෙසැම්බර් මස 24 දින දහවල් 12 පෙරක් පිළි වෙලින් පහත සඳහන් කාර්යාලවලින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක.

(අ) කොළඹ-1, ඇව්ලොක් චතුරශ්‍රයේ කොළඹ පොලිස් අධිකාරී කාර්යාලය,
(ආ) වවුනියාව පොලිස් අධිකාරී කාර්යාලය.

3. මෙසේ ලබා ගන්නා ටෙන්ඩර් ආකෘති පත්‍ර (පිටපත් 2 කින් යුතුව) කොළඹ-1 පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති, 1973 දෙසැම්බර් 26 දින පෙ. ව. 10 ට පෙර ලැබෙන සේ එවිය යුතුය. නැතිනම් ඒවා නියමිත දින නියමිත වේලාවට කලින් පොලිස් මූලස්ථානයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

4. 1973 දෙසැම්බර් මස 26 දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරු වනට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

5. වැඩිදුර විස්තර පිළිවෙලින් කොළඹ 1, පොලිස් අධිකාරී කාර්යාලයෙන් සහ වවුනියා පොලිස් අධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැක.

පොලිස් පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 නොවැම්බර් මස 27 වැනි දින.

12-81—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

### වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශය
### (ප්‍රාදේශීය අංශය)

ඇසුරුම් පෙට්ටි සෑදීමේ ලෑලි සැපයීම—1974

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ (ප්‍රාදේශීය අංශයේ) ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ඇසුරුම් පෙට්ටි සෑදීම පිණිස අවශ්‍ය අඟල් 1 සහ අඟල් 1/2 ක් ලෑලි සැපයීම සඳහා ටෙන්ඩර් පත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් හා ශ්‍රී ලංකා පුරවැසියන් ගෙන් සමන්විතවූ ආයතනයන්ගෙන් 1973 දෙසැම්බර් මස 28 වැනි දින පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. අමාත්‍යාංශ කාර්යාලයේ හෝ ඕනෑම දිසා අධ්‍යක්ෂ කාර්යාලයක හෝ රු. 50 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පහත සඳහන් කාර්යාලයෙන් 1973 දෙසැම්බර් මස 27 වැනි සුරු දින ප. ව. 3 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර [illegible] ඉදිරිපත් කළ යුතුය.

3. වැඩි විස්තර කොළඹ 1, [illegible] කාර්යාල [illegible] වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයෙන් (ප්‍රාදේශීය අංශය) ලබාගත හැක.

ජේ. සී. ඩී. ද එස්. විජේනායක,
ලේකම් වෙනුවට.

1973 නොවැම්බර් මස 30 දින,
කොළඹ 1, [illegible] කාර්යාල ගොඩනැගිල්ලේ
පිහිටි වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ දී ය.

[illegible]—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

12. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නහොත්, හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වහොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා සේ සැලකනු ලැබේ.

13. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත් ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ බලය සහ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ බලය ආණ්ඩුව වෙත තබාගනු ලැබේ.

15. වැඩ පැහැර ගැටිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ නම තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුලත් වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට විරුද්ධ වෙන හෝ කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. වැඩි විස්තර කුණ්ඩසාලේ, කෘෂිකර්ම විද්‍යාලයේ විදුහල්පතිගෙන් දැනගත හැකිය.

ආර්. ආල්. සී. ඉලංගකෝන්,
ආචාර්ය අර්නස්ට් අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(වයාප්ති).

1973 නොවැම්බර් මස 27 වැනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

12-129—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

## කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

### ජලකර වායුව පිළියෙල කිරීමට අවශ්‍ය ඇලුමිනියම් කැබලි සැපයීම සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට හොණ්ඩර 40 ක් පමණ ඇලුමිණියම් (කැබලි වශයෙන්) වුවමනා කර තිබේ. (එසේ වුවමනා කරන්නේ ලියන පට්ටලයෙන් කැපී යන කැබලි, යම් යම් වැඩට ඇලුමිණියම් පාවිච්චි කිරීමේදී ඉතිරිවන කැබලි, තුනී කොල ආදී වශයෙනි) මෙම කැබලි සාමාන්‍ය බෙලෙක් වැඩ කරුවෙකුගේ කතුරෙන් කැපිය හැකි තුනී ඒවා විය යුතුය. තුනී කොල හෝ කැබලි වශයෙන් සපයන්නේ නම් තීන්ත, කඩදාසි ආදී අපිරිසිදු දේ ඉවත් කොට සැපයිය යුතුය.

1974 පෙබරවාරි මස 5 දින හෝ ඊට පෙර මෙම ඇලුමිනියම් සැපයිය යුතුය.

මෙම ද්‍රව්‍ය සැපයීමට බලාපොරොත්තු වන්නන් මිල ගණන් හා සැම්පල් සීල් යෙදූ කවරවල බහා 1974 ජනවාරි 05 වැනි දින දහවල් 12 ට පෙර මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. මිල ගණන් දැක්විය යුත්තේ, ගෝනිවල දමා, හොණ්ඩරයක් කීය බැගින් මෙම කාර්යාලයට සැපයිය හැකිද යනුයි.

අධ්‍යක්ෂ,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

1973 නොවැම්බර් මස 23 දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත, කොළඹ—7.

11-93—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### අමු ඖෂධ සැපයීම සඳහා ටෙන්ඩර්

### ආයුර්වේද රෝහල, රත්නපුර සහ අනුරාධපුර, ආයුර්වේද පර්යේෂණායතනය, නාවින්න

1974 ජනවාරි 01 දින සිට 1974 දෙසැම්බර් 31 දින දක්වා (දෙදිනම ඇතුළුව) පහත දැක්වෙන ආයතනවල අවශ්‍ය ආයුර්වේද අමු ඖෂධ සැපයීම් සඳහා කොළඹ 8, කෝට්ටේ පාරේ, අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 12. 27 දින පෙ. ව. 10.00 දක්වා ලාංකිකයින්ගෙන් වෙන වෙනම සීල් තැබූ ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මුදලින් රු. 50ක් සැව්වේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ හෝ ආයුර්වේද කොමසාරිස් නමට තැන්පත් කොට, ටෙන්ඩර් ෆෝරම් ලබා ගැනීම සඳහා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1973. 12. 26 දින දහවල් 12. 00ට පෙර ටෙන්ඩර් ෆෝරම ලබාගත යුතුය. තැපැලෙන් ටෙන්ඩර් ෆෝරම ඉල්ලුම් කරන අය විසින් ටෙන්ඩර් භාරගන්නා අවසාන දින හා වේලාවට පෙර ඒවා ලබාගෙන ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, තම කුවිතාන්සි කල් ඇතිව ඉදිරිපත් කළ යුතුයි.

3. මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම්වල, ටෙන්ඩර් පිටපත් දෙකක බැගින්. කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩරය ඉදිරිපත් කරන්නේ කවර ආයතනයක් සඳහා ද යන බව සීල් තැබූ ටෙන්ඩර් බහා ඇති ලිපි කවරයේ උඩ වම් කෙළවරේ පැහැදිලිව ලිවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනයද ලිපි කවරයේ ලිවිය යුතුයි.

4. කෙසේ වුව ද ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් කැමති නම්, සීල් තැබූ ටෙන්ඩර්, ඒවා භාරගැනීමට බලය ලත් නිලධාරියා වන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කායසීල සහ කාරට පෞද්ගලිකව භාරදිය හැක. ටෙන්ඩර් භාරගත් බවට කුවිතාන්සියක්, මුද්‍රා තැබූ ටෙන්ඩර් භාරදුන් තැනැත්තාට ඔහු විසින් නිකුත් කරනවා ඇත. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් සලකා බලනු නො ලැබේ.

5. මෙහි ඉහළ 1 වැනි ඡේදයේ සඳහන් දින. නියමිත වේලාවට එම ස්ථානයේ දී ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේ දී සියළුම ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඔවුන් විසින් ඉදිරිපත් කොට ඇති මිළ ගණන් කියවනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කොට ඇති ඕනෑම ටෙන්ඩරයක අනුපිටපත පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

6. ටෙන්ඩර් විවෘත දින සිට මසක් ගතවන තුරු සියළුම ටෙන්ඩර් කරුවන් තම ටෙන්ඩර්, පිළිගැනීම සඳහා විවෘතව තැබිය යුතුයි.

7. අවශ්‍ය ඖෂධ සියල්ලම සැපයීමට මිළ ගණන් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

8. පිළිගත් ටෙන්ඩර්කරු/ටෙන්ඩර්කරුවන්, තමාට/තමන්ට ප්‍රදානය කරනු ලබන විෂයන්ගේ මුළු වටිනාකමින් 5% ක් ඇප මුදල් වශයෙන් තැන්පත් කොට කොන්ත්‍රාත්තුව නිසි අයුරු ඉටු කිරීම වෙනුවෙන් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට එළඹිය යුතු වේ.

9. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

වී. බ. වැවෙගම,
ආයුර්වේද කොමසාරිස්.

1973. 11. 28 දින,
කොළඹ 8.
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

12-172—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### පරණ ගොඩනැගිල්ල කඩාදමා, එම ද්‍රව්‍යයන් හා අනවශ්‍ය ශේෂ බඩු සුන්බුන්

කොළඹ 2, සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි වර්ග අඩි 813 ක පරණ ගොඩනැගිල්ල කඩා දමා, එම ද්‍රව්‍යයන් හා සුන්බුන් ඉවත ගෙන යාම සඳහා, 1973.12.14 දින පෙරවරු 10 දක්වා ජාතික නිවාස කොමසාරිස් විසින් මුද්‍රිත ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. වැඩිපුරම මුදලක් සඳහන් ටෙන්ඩර් අයදුම්කරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කරනු ලැබේ. වැඩිදුර විස්තර, කාර්යාලීය වේලාවන් තුළ ජාතික නිවාස දෙපාර්තමේන්තුවේ ගබඩා අංශයෙන් විමසා දැනගත හැක.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2.
1973 නොවැම්බර් 26 දින.

12-77—1973.12.07 දින අංක 89 දරන ගැසට් පත්‍රය

**කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව**

නාත්තන්ඩිය කැඳ දැමීමේ ආයතනය අළුත්වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973. 12. 28 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 20,000 කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ තැන්පත් කොට 1973. 12. 27 දින මධ්‍යහන 12ට පෙර කුවිතාන්සි හා ලියා පදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(1/73)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 11. 26.

12-50—73. 12. 07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව—කළුතර කොට්ඨාශය**

**කිරි නොමැතිව පිසූ ආහාර**

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**— වර්ෂ 1974 ජනවාරි 1 වනදා සිට 1974 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකික යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කළුතර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර බාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, ගාල්ල, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝරමයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝරම් ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ටෙන්ඩරකරුවන් ටෙන්ඩර් පෝරම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝරම සඳහා ඉල්ලුම් කිරීමට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝරම ලබාගැනීමට යතුපු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට මේ සමග ඇති උපලේඛනයේ 5 වැනි තීරුව බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, කළුතර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර පත බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන්වූ පසුව ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක මා විසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝරමයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් දැනුම ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝරමයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩරයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවති නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩරකරු මෙහි පහත පෙනෙන උපලේඛණයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සළසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3¼ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයෙහි දක්වා ඇති සහල් අවුන්ස 9 ප්‍රමාණය අවුන්ස 7 වශයෙන් වෙනස් කර ඇති නිසා 1972 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු ආහාර කොමසාරිස් විසින් විටින් විට නියෝග කරන ලද මිළට ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ. යම්කිසි අවස්ථාවකදී සලාක සහල් සැපයුව හොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුන හොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්පලට ලබාගන්නා සහල් දුනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්පලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩු කරගනු ලැබේ.

එම්. වී. ඒ. බලසේකර,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී.

1973 නොවැම්බර් 26 වැනි දින,
කළුතර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදීය.

## උපලේඛනය

| (1) ආයතනය | | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | මස් | කරවල | බිත්තර | එළවළු | රෝගීන්ට: මස් | මාළු | කරවල | බිත්තර | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | අළුත්ගම්විදිය ගැමි රෝහල ... | 100 | 400 | 1973 දෙසැම්බර් 27 දින පෙරවරු 10.00 ට | 85 | 85 | 83 | 70 | 265 | 548 | 507 | 518 | 452 | 1,667 |
| 2. | ගල්පාත ගැමි රෝහල ... | 100 | 600 | | 206 | 206 | 207 | 223 | 638 | 313 | 311 | 329 | 307 | 994 |
| 3. | මාතෘ නිවාසය, බණ්ඩාරගම ... | 100 | 400 | | 80 | 84 | 83 | 24 | 297 | 47 | 36 | 46 | 13 | 164 |
| 4. | මාතෘ නිවාසය, වාද්දුව ... | 100 | 300 | | 77 | 78 | 78 | 78 | 314 | 31 | 21 | 30 | 28 | 98 |
| 5. | රජයේ රෝහල, ඉත්තෑපාන ... | 100 | 600 | | 167 | 165 | 174 | 169 | 510 | 876 | 931 | 955 | 941 | 2,823 |
| 6. | රජයේ රෝහල, නෑබඩ ... | 100 | 1,000 | | 520 | 520 | 499 | 503 | 1,552 | 2,009 | 1,897 | 1,967 | 1,740 | 6,164 |
| 7. | රජයේ රෝහල, මීගහතැන්න ... | 100 | 600 | | 1[illegible]9 | 127 | 126 | 129 | 402 | 1,867 | 1,832 | 1,784 | 1,[illegible]81 | 5,940 |

12-8[illegible]—73.12.07 අංක 89 දරණ ගැසට් පත්‍රය

---

යොමු අංකය : සීඩී/45/72.

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ රෝහල් මණ්ඩලය

### කොළඹ රෝහල් මණ්ඩලයේ ආයතනවල ඉඳුල් කෑම විකිණීම

1974. 1. 1 වන දින සිට 1974. 12. 31 වන දින දක්වා වූ කාලය තුළ මෙහි සඳහන් උපලේඛනයේ දැක්වෙන රෝහල්වල මුළුතැන් ගෙවල බැහැර ලන ඉඳුල් කෑම මිලදී ගෙන යෑම සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතන වලින් 1973 දෙසැම්බර් මස 21 වන දින පෙරවරු 10 වනතුරු කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමේදී එක් එක් ආයතනය (අංශය) සඳහන් වෙන් වෙන් වශයෙන් මාසික මිල ගණන් සඳහන් කළ ටෙන්ඩර් පත් පිටපත් දෙකකින එවිය යුතු අතර, එය බහාලන කවරයේ වම් කෙළවරේ උඩ "ඉවත ලන ඉඳුල් කෑම විකිණීම" යනුවෙන් සඳහන් කළ යුතුය. කවරය තුල බහා සීල් තබන ලද සෑම ටෙන්ඩර් පත්‍රයක් ම මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එව්මෙන් 1973 දෙසැම්බර් මස 21 වන දින පෙරවරු 10 ට පෙර මා වෙත ලැබෙන්න සැලැස්විය යුතුය.

3. ඉදිරිපත් කරනු ලබන සෑම ටෙන්ඩර් පත්‍රයක්ම 1973. 12. 21 වන දින පෙරවරු 10 ට කොළඹ රෝහලේ මණ්ඩලීය අධිකාරී තැනගේ කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

4. මේ ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති සියළුදෙනාටම පැමිණ සිටිය හැක. පැමිණ සිටින අයගේ දැන ගැනීම සඳහා නම්, හා මිළ ගණන් කියවනු ලැබේ.

5. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ආයතනයන්වල ඉඳුල් කෑම දිනපතා ඉවත ගෙන යන බවට හා එම සේවාවන් හරියාකාරව ඉටු කරන බවට ගිවිසුමකට බැඳිය යුතු අතර, ඒ උපලේඛනයේ දැක්වෙන පරිදි ඇපයක් ද තැබිය යුතුව ඇත. මේ ඇප මුදල කොන්ත්‍රාත්තුව අවසානයේදී කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

6. මේ ආයතනවල ඉවත ලන ඉඳුල් කෑම සඳහා කරනු ලබන මාසික ගෙවීමේ ගාස්තු ඒ මාසයේ 1 වන සේවා දිනයේ දහවල් 12 ට පෙර ගෙවිය යුතුය.

7. මහ රෝහලේ ඉඳුල් ආහාර කොටස් තුනකට බෙදා ඇත :—

(අ) මුළුතැන්ගෙවල ඉඳුල් කෑම.

(ආ) වාට්ටුවලින් ඉවත ලන ඉඳුල් කෑම ආදිය.

(ඇ) කොළඹ හෙදි විදුහලේ මුළුතැන්ගෙවල ඉඳුල් කෑම යනාදී වශයෙන්.

8. මේ පිළිබඳ වැඩි විස්තර මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ජේ. ඩී. ප්‍රනාන්දු,
කොළඹ රෝහල් මණ්ඩල අධිකාරී.

1973 නොවැම්බර් 23 දින,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී කාර්යාලයේ,
මුදල් අංශයේදී ය.

## උපලේඛනය

| ආයතනය | | ඇප මුදල රු. | ශ. |
|---|---|---|---|
| 1. කාසල් වීදියේ කාන්තා රෝහල, කොළඹ | ... | 50 | 0 |
| 2. ද සොයිසා කාන්තා රෝහල, කොළඹ | ... | 50 | 0 |
| 3. ළමා රෝහල, කොළඹ ... | ... | 50 | 0 |
| 4. නයනා රෝහල, කොළඹ ... | ... | 50 | 0 |
| 5. මහරගම පිළිකායතනය ... | ... | 50 | 0 |
| 6. මහ රෝහල— | | | |
| (අ) මුළුතැන්ගෙවල ඉඳුල් ආහාර | ... | 100 | 0 |
| (ආ) වාට්ටුවලින් ඉවතලන ඉඳුල් ආහාර ආදිය | ... | 100 | 0 |
| (ඇ) කොළඹ හෙදි විදුහලේ ඉවත ලන ඉඳුල් ආහාර ... | ... | 50 | 0 |
| 7. පුනරුත්ථාපන රෝහල, රාගම ... | ... | 50 | 0 |
| 8. දකුණු කොළඹ රෝහල, කළුබෝවිල | ... | 50 | 0 |

12-160—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

කොළඹ රෝහල් මණ්ඩලයේ විකිර්ණ විද්‍යා අංශවල පරිහරණයෙන් පසු ඉවත ලනු ලබන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය විකිණීම

1973 ජනවාරි 01 වන දින 1974 දෙසැම්බර් 31 වන දින දක්වා පුරා කාලය තුල මෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ආයතනයන්වල විකිරණ විද්‍යා අංශයන්හි කළුවර කාමරවලින් ඉවත ලන රසායනික මිශ්‍රිත පික්සර් ද්‍රාවණය විකිණීම සඳහා කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීන් විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

2. කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී වෙත ඉල්ලුම් කිරීමෙන් ලබා ගන්නා ලද පෝර්මවල පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන නියමිත පෝර්මයේ රු. 150 නොඅඩු මිල ගණන් සඳහන් ටෙන්ඩර් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ.

3. කොළඹ කච්චේරියේ රු. 100 ක ටෙන්ඩර් ගාස්තු මුදලක් තැන්පත් කර ඒ බවට ලබාගන්නා ලද කුවිතාන්සි පතක් කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී වෙත 1973 දෙසැම්බර් 20 වෙනි දින දහවල් 12 ට පෙර ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීන් විසින් ලිපියකින් දන්වනු ලැබීමෙන් දින 14 ක් ඇතුලතදී ටෙන්ඩරයේ සම්පූර්ණ වටිනාකම තැන්පත් කිරීමට නුපුලුවන් වූයේ නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටී නම්, ඔහු විසින් තැන්පත් කර ඇති මුදල රාජසන්තක වෙනු ඇත.

4. පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් බහාලූ කවරයේ වම් පස කෙලවරේ **"පරිහරණයෙන් පසු ඉවත ලන පික්සර් ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා ටෙන්ඩරය"** යනුවෙන් සඳහන් කර සීල් තබා 1973 දෙසැම්බර් 21 වන දින පෙරවරු 10 ට පෙර කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීන් නමට ලේඛනගත තැපෑලෙන් එවීමෙන් හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමෙන් හෝ මා වෙත ලැබෙන්න සැලැස්විය යුතුය.

5. 1973 දෙසැම්බර් 21 වන දින උදේ 10 ට කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරීගේ කාර්යාලයේදී මෙම ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. මිල ගණන් ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුවනට මනාප නම් මේ අවස්ථාවේදී මෙහි පෙනී සිටිය හැක.

6. සාර්ථකවූ ටෙන්ඩර්කරු මෙහි පහත උපලේඛනයේ දක්වෙන ආයතනයන්වල එකී රසායනික මිශ්‍රණයන් නිතිපතා මිලදී ගන්නා බවට හා එම සේවාවන් හරියාකාරව ඉටුකරන බවට ගිවිසුමකට බැඳිය යුතු අතර, ඒ උපලේඛනයේ දැක්වෙන පරිදි ඇපයක් ද තැබිය යුතුය. මේ ඇප මුදල කොන්ත්‍රාත්තුව අවසානයේදී කොන්ත්‍රාත්කරුට ආපසු ගෙවනු ලැබේ.

7. මේ ආයතනවලින් මිලදී ගනු ලබන එකී රසායනික මිශ්‍රණයන් සඳහා ගෙවනු ලබන මාසික ගෙවීම් ගාස්තු ඒ මාසයේ 10 වෙනි දෙස්වා දිනයේ දහවල් 12 ට පෙර ගෙවිය යුතුය.

8. මොනම ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩර්පත්‍ර සමහරක් හෝ සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය වෙත තබාගනු ලැබේ.

බී. ජී. ඩී. ප්‍රනාන්දු,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී.

1373 නොවැම්බර් 23 දින,
කොළඹ රෝහල් මණ්ඩලීය අධිකාරී
කාර්යාලයේදී.

### උපලේඛනය

| | ආයතනය | බලාපොරොත්තුවන මිශ්‍රණ ප්‍රමාණය | ඇප මුදල රු. ශත. |
|---|---|---|---|
| 1. | කොළඹ මහ රෝහල | ගැ. 60.00 | 500 00 |
| 2. | එම ළමා රෝහල | ගැ. 10.00 | |
| 3. | මහරගම පිලිකායතනය | ගැ. 4.00 | |
| 4. | දකුණු කොළඹ රෝහල | ගැ. 30.00 | |
| 5. | රාගම පුනරුත්තාපන රෝහල | ගැ. 4.00 | |

12–159—73.12.07 දින අංක 89 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1974 ජනවාරි 01 වැනිද සිට 1974 දෙසැම්බර් 31 වෙනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත්කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම්පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍යසේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

**ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උප ලේඛනයෙහි 5 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළයුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර්පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධි-කාරි/ලේකම්ට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ ''බී'' උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවහොත් ටෙන්ඩර් පෝර්මයෙහි ''සී''

උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර්පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද, පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

